ලක්ෂ්මන් කොඩිතුවක්කු ලියන
වෙසක් කෙටිකතාව

මොහොමඩ්ගේ කතා වස්තුව

මොහොමඩ්..... බුදුරුස් මාලාව එන්නෙ ඔතෙන්ට මල්ලි තව පටි දෙකක් යන්න ඕනෙ බං'' ආරියපාල අයියා පහළ සිට බෙරිහන් දුන්නේය.

''බඩු මදි තව ඕන ආරි අයියා''මොහොමඩ් ප්‍රතිඋත්තර බැන්දේ පිටුපස පලංචි කොටයේ වාඩිවී. පුවක් කණුවට වැලමිට හිර කරමින්ය.

''ඒයි ඇන්ටොන් ඔතනින් බඩු එන්නේ,.... එනකොටම උඩට එවපං'' මොහොමඩ් පහළ කොටසේ වැඩ කරන ඇන්ටන්ට එසේ කීවේ කෙළ පහරක් බිමට පතිත කරමිනි. බොරැල්ල නගරයේ වෙළඳුන්ගේ සංගමය මගින් මෙවර ඉදිකරන මහා තොරණ් රාජ්‍යාගේ පුවක් කණු සිටවීම, සැකිල්ල හැදීම, පින්තූර රාමු සවිකිරීම ආදියේ කොන්ත්‍රාත්තුව බාරගත්තේ ආරියපාල අයියාය. ආරියපාල අයියාට මොහොමඩ් මුණ ගැසුනේ මීට වසර කීපයකට පෙර නිර්මාණය කරන ලද පිටකොටුවේ තොරණ නිසාය. ආරියපාල අයියා එදා තොරණේ උඩ වැඩ කළේය. පහළ සිට අත් උදව් දුන් අය අතර මොහොමඩ් ද සිටියේය. ආරියපාල අයියා එදා පිටකොටුවේ බක්කි සේවකයෙකු ලෙස වැඩ කළ නිසා තොරණට සම්මාදම් විය. මොහොමඩ් ද අහම්බෙන් එතනට වැටුනේ පිටකොටුවේ කුලි වැඩ කරපු නිසාය. ස්වේච්ඡාවෙන් සේවය කළ මිතුරු කැලේ සිටි ආරියපාල අද මොහොමඩ්ගේ මිතුරෙකු වී ඇත. එසේ මුණ ගැසුණු ආරියපාල අයියා අද තොරණ සවිකිරීමේ කොන්ත්‍රාත් බාරගෙන වෙසක් කාලයට පමණක් කොන්ත්‍රාත්කරුවෙකු වී ඇති අතර තොරණවල පළපුරුද්දක් ලබා ඇති මොහොමඩ්ව එයට සම්බන්ධ කර ගන්නේ දැඩි කැමැත්තෙනි. අනෙක් කාලවලදී ගොඩනැගිලිවලට මේසන් බාස් වරුන්ගේ අත් උදව්කරුවෙකු ලෙස සේවය කරන මොහොමඩ් වෙසක් කාලයට අත් උදව් දෙන්නේ තොරණවලටය. තමාද ආරියපාල අයියා දන්නා හඳුනන අය සහභාගි කරවාගෙන තොරණ ඉදිකරන මොහොමඩ්ට අන් අයට වඩා තරමක් වැඩිපුර මුදලක් අතට ලැබෙන්නේ ආරියපාල අයියාගේ මිත්‍රත්වය නිසාය.

පුවක් පටි සහ ලණු රෝල් උඩට එන තුරු සැකිල්ල මුදුනේ සිට මොහොමඩ් බොරැල්ල හංදිය දෙස නෙත් යොමු කළේ ඒ ඉසඹුවෙන් මඳ විවේකයක් ගන්නටය.
උදයේ වැස්සක් වැටී අතස දැන් කිරිපාට වී ඇත. එහෙත් පුවක් කඳන්වල තෙත ගතිය තවම වියළී ගොස් නැත. හවස් යාමයේ පායා ඇති චණ්ඩ හිරු රශ්මි තවමත් මොහොමඩ්ලාගේ ඇඟට වද දෙන්නෙ දැන් ඇති බිමට බැහැපන් කියන්නාක් මෙනි. රාජකාරිය තිමවී නිවෙස් වලට යන මිනිස්සු බොරැල්ල නැවතුම් පොළේ පෝලිම් ගැසී තෙරපෙති. පදික වීදිය පුරා අටවා ඇති වෙළඳ කූට වලට මිනිසුන් රංගන්නේ දැන් ය. වාසනාව විකුණාන්නන්ගේ මයික්‍රපෝන් හඬ මොහොමඩ්ට ඇසෙන්නේ නටන වතුර කේතලයකින් පිටවන කෙඳිරිලි හඬක් සේය.දහවල් කාලයේ පාළුවට ගොස් තිබූ බොරැල්ලේ සුපර් මාර්කට් බිල්ඩිම තුළට මිනිසුන් එකා දෙන්නා ඇදෙන හැටි මොහොමඩ්ට හොඳින් පෙනෙයි. තොරණේ උඩ සිට ඈතට පෙනෙන කොටුවේ උස් ගොඩනැගිලි ටික දකින විට මොහොමඩ්ගේ හිතට දැනෙන්නේ අමුතු ගාම්භීරත්වයකි. ඒ ඔහු උස ගොඩනැගිලිවල බොහෝ වේලාවට අත් උදව් කරුවෙකු ලෙස වැඩ කර ඇති නිසාය.

''ඒවා අපි හදපු බිල්ඩිං''ඔහු වත්තට ගොස් තම හැකියාව කියාපාන්නේ ඒ ලෙසය. බොරැල්ලේ තොරණ ද මොහොමඩ්ලා ගේ දැතින් ඉදිවෙන බව වත්තේ බොහෝ දෙනෙක් දන්නේ මොහොමඩ් නිසා මය. උඩ වැඩ කරන බොහෝ වේලාවට පහළට කුඩාවට පෙනෙන මිනිසුන් දකින විට මොහොමඩ්ට මතක් වෙන්නේ මහගිරිදඹ ය. ජීවිතයේ එකම එක වතාවක් සිරිපාද වන්දනාවේ ගියේ වත්තේ අල්පෝන්සෝ අයියා නඩේ ගුරා ලෙස සංවිධානය කළ වන්දනා ගමන නිසාය.

කාලයක් පෙරුම් පුරාගෙන සිටි මල්කාන්ති සමග ආදර බස් තෙපලන්නට හැකි වුනේ ද ඒ නිසාය. මල්කාන්ති ද වත්තේ එකියකි. මල්කාන්ති ගැන ආදර ගීතක් පහළ වුව ද, වත්තේදී එය කියා ගන්නට තරම් ශක්තියක් තිබුණේ නැත. කටපුරා සිනාසෙමින්''ආ මොහොමඩ් අයියා කොහොමද ?''කියා නිතරම අසන මල්කාන්තිගේ සිරියාවට ඔහු වශීවී සිටියේය.

මල්කාන්ති මහගිරිදඹේ පඩි පෙළක පැටලී පය ලිස්සූ මොහොතේ ඇය වෙත පැන අතින් අල්ලා එය වැළැක්වූයේ මොහොමඩ්ය. රළුවූ අත්වලට ඇයගේ සිනිඳු කෝමල, සීතල අත්ල ගැටෙන විට ''මම ඔයාට ආදරෙයි.'' කියා කියාගන්නට තරම් ධෛර්යයක් මොහොමඩ්ට උපන්නේය. ''අපේ අම්මල කැමතිවෙන එකක් නැහැ අයියා'' මල්කාන්ති කිව්වේ දුකෙනි.''-අපි ඔක්කොම වත්තෙ උපන් එවුන්... මෙච්චර කල් එකට ජීවත්වුනේ..... ජාති ආගම් භේද බලලද නංගි''?

මොහොමඩ් කිව්වේ සීතලෙන් වෙව්ලන දැත අයය වෙත පිරිහමමින් ය.''මම මොහොමඩ් අයියට කැමතියි''''මොහොමඩ් ඔන්න බඩු ටික එනවෝ, අද රෑ වෙන්න ඉස්සෙල්ලා ඕක ඉවරයක් කරන්න ඕනෝ'' ආරියපාල අයියාගේ හේෂාරවයෙන් පිටවූ අඩහැරීන් තිගැස්සුණු මොහොමඩ්ගේ අතීතය බිඳී ගියේ ය. තවත් දෙදෙනෙකු සමග ඔහු පලංචියට පැත්තේ බුදුරුස් මාලා සැකිල්ල අහවරක් කරන්නට ය.බිම් කළුවර වැටෙන්නට දැන් ඇත්තේ සුළු වේලාවකි.

දැඩි අව් රශ්මියෙන් පීඩා විඳි මොහොඩ්ලාගේ ඇඟට සිහිල් සුළඟ පතිත වෙන්නේ දැන්ය. අවරට යන හිරුගේ රැස්වලින් සෑදී ඇති තොරණේ සැකිල්ලේ සෙවනැල්ල දිගට වී බොරැල්ල නගරයේ පතිත වී ඇත. ඒ තැන් තැන්වලින් මොහොඩ්ලා ඇදවී දික්වී කෙටිවූ වූ යෝධයන් මෙන් පෙනෙයි.''ආරි අයියා වෙලාව කීයද?''කොල්ලෙක් අසයි.

''ආ දැන් බැහැපල්ලා. හෙට උදේ ඉතුරු ටික බැඳලා පින්තූර හයිකරන්න පුළුවන්, හෙට දවල්ට පිංතූර ටික එයි.''සියල්ලෝම තම ගතමනාව ගෙන විසිර ගියේ හෙට එන බවට ආරි අයියාට පොරොන්දු වෙමිනි.
සිගරැට්ටුවක් උරමින් සිට එහි කොටය පැත්තට විසිකළ මොහොමඩ් ආරියපාල අයියාගෙන් ගතමනාව ගත්තේ විහිළුවක්ද කරමිනි. එතනින් ඉදිරියට අදදී උපවංශ හෝටලයට ගොඩවුණු මොහොමඩ් මාළුපාන් ගෙඩි දෙකක් ගිල දමා ප්ලේන්ටියක් බී, වේටර්ට කියා තවත් මාළුපාන් ගෙඩි කිහිපයක් සිලි සිලි බැගයක දාගත්තේ ගෙදර ගෙනියන්නටය.කොහොමද අයියා තොරණේ වැඩේ නැගලා යනවද? වේටර් කොලුවා ඇසුවේ සිනා

සෞම්‍ය රාත්‍රිය

සිසිර දිසානායක

මේ වන විට මෙල්බන් නුවර අපගේ කලා පුරයක් බවට පත්වෙමින් පවතියි. සෑම සති අන්තයක ම, දින දෙකෙහිම පැවැත්වෙන කලා කටයුතු අතර, ගීත ප්‍රසංග වලට මුල් තැනක් ලැබෙයි. මව් බිමේ ප්‍රවීණ ශිල්පීන්ගේ ප්‍රසංග මෙහිදී වැඩි ජනප්‍රියත්වයක් ලබනා බව ද පෙනී යයි.

කෙසේ වුවද එවන් ප්‍රවීණ ශිල්පීන්ගේ ගීත ප්‍රසංග අතරින් යම් කිසි විශේෂත්වයක් ගන්නා ප්‍රසංගයක් ජුනි මස 13 දා රිංවුඩ් ප්‍රදේශයේ පැවැත්වීමට සංවිධානය වෙයි. ඒ "සෞම්‍ය රාත්‍රිය" ප්‍රසංගයයි. මුල් වරට විශාරදවරියන් දෙදෙනෙකු එක්ව මෙහි පවත්වන ප්‍රසංගයයි "සෞම්‍ය රාත්‍රිය". විශාරදවරියන් දෙදෙනා වන්නේ නන්දා මාලනී හා දීපිකා ප්‍රියදර්ශනී ප්‍රවීණ ගායන ශිල්පිනීන් දෙපලයි.

සෞම්‍ය රාත්‍රිය පිළිබඳව අදහස් දැනගැනීම සඳහා මුලින් ම අපි විශාරද නන්දා මාලනියව පුරතනයෙන් සම්බන්ධ කර ගත්තෙමු.

"ඇත්තටම අපි මෙල්බන් නුවර ප්‍රසංග වාර ගණනාවකටම සම්බන්ධ වෙලා තියෙනවා. ඉතින් ඒ හැම වාරයකම හැමෝම අපිව ආදරයෙන් පිළිගත්තා. ඒ වගේම ඒ ප්‍රසංග බොහොම සාර්ථක වුණා." නන්දා මාලනිය සිය හඬ මව් බිමේ සිට අවදි කළාය.

"මෙල්බන් වාගේම ඕස්ට්‍රේලියාවේ ම ඉන්න රසිකයින්ගේ රසවින්දනය තවමත් හොඳින් තියෙනවා. ඒකයි ඒ සාර්ථක බවට වගේම අපට දක්වන ලෙන්ගතුකමට මුල්ම හේතුව. ඒ අය ශ්‍රී ලංකාවේ සාහිත්‍ය, කලාව ගැන අවදියෙන් ඉන්නවා. නිතරම ගීත අහනවා, නාට්‍ය, චිත්‍රපට බලනවා... ඇත්තට ම ලංකාවේ ඉන්න අයට නොදෙවෙනිව මේ දේවල් අගය කරනවා."

"ඒ වගේම මෙල්බන් වල ඉන්න බොහොමයක් දෙනා අපේ යාළුවෝ බවටත් පත්වෙලයි තියෙන්නේ. ඒ අය අතරින් වැඩි දෙනෙක් රසිකයන් විදියට අපිව අඳුනාගත්ත අය. ඉතින් ඒ අය කොහොම හරි ඉඩක් හොයාගෙන අපේ ගීත අහන්න, අපිව මුණගැහිලා වචනයක් කතා කරන්න එනවා. ඉතින් මේ සෞම්‍ය රාත්‍රියේදිත් අපි ආසාවෙන් ඉන්නවා අපේ ඒ ආදරණීය රසික හිතවතුන් මුණ ගැහෙන්න. ඉන්ද්‍රජිත් මිරිහාන තරුණ ශිල්පියාගේ මෙහෙයවීමට දක්ෂ වාදක මණ්ඩලයක් එක්ක ඉදිරිපත් කරන මේ ප්‍රසංගය ඒ රසිකයින්ට හොඳ අත්දැකීමක් වේවි.

අනික, පළවෙනි වතාවටයි මම මේ දීපිකා ප්‍රියදර්ශනීත් එක්ක මේ වාගේ යුගල ප්‍රසංගයකට සහභාගි වෙන්නෙ. ඇත්තටම දීපිකා අපට පස්සේ කාලයක මේ ගායනා ක්ෂේත්‍රයට එකතු වුණ දක්ෂ ගායිකාවක්. දක්ෂකම වගේම ඇය හොඳ දේ තෝරාගෙන යොදා යමක් කරපු ශිල්පිනියක්. ඒ නිසයි මම ඇයත් එක්ක මේ විදිහේ ප්‍රසංගයක් කරන්න එකඟ වුණේ. ඉතින් ඒක රසිකයින්ටත් අත්විඳින්න ලැබෙන දුර්ලභ අත්දැකීමක් වේවි." විශාරද නන්දා මාලනියගේ සිනා හඬ අතරේ පිළිසඳර හිමා කර අපි ඇයට ස්තූතිය පිරිනැමුවෙමු.